# රජයේ නිවේදන

## 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

## 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය.

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි; එනම් -

1. ඉහතකී පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගනු ලැබ ඇති හම්බන්තොට ජාත්‍යන්තර වරාය ඇතුළත වූ අපනයන වෙළඳපොළ සඳහා අර්ධ වානේ රේඩියල් ටයර් සහ සම්පූර්ණ වානේ රේඩියල් ටයර් (ට්‍රක්රථ සහ බස්රථ රේඩියල් ටයර් - TBR, මගී මෝටර්රථ රේඩියල් ටයර් - PCR) නිෂ්පාදනය කිරීම සඳහා වූ සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් යන ව්‍යාපෘතියට අදාළ තොරතුරු අන්තර්ගත නිවේදනය 2021.01.05 දින අංක 2209/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

2. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ නම "සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" ("ව්‍යාපෘතිය") විය යුතුය.

3. ව්‍යාපෘතිය මාස තිස් හයක (36) කාලයක් ඇතුළත ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(3) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබීමේ දින සිට ගණනය කරනු ලැබිය යුතුය.

4. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(3) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමේ දින සිට ආරම්භව මාස තිස් හයක (36) කාලසීමාවක් ඇතුළත ව්‍යාපෘති සමාගම විසින් ස්වකීය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතුය.

## උපලේඛනය

**(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත.**

**ආයතන ආදායම් බද්ද (CIT)**

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(3) උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමේ දින සිට ගණනය කරනු ලබන අවුරුදු දොළහක (12) කාලසීමාවක් සඳහා ආයතන ආදායම් බද්ද ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

ඉහත කී අවුරුදු දොළහක (12) බදු ගෙවීම් නිදහස් කාලසීමාව අවසන්වීමෙන් පසුව, ව්‍යාපෘති සමාගමේ ව්‍යාපෘතිය විසින් උත්පාදනය කරනු ලබන ලාභ සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා ආයතන ආදායම් බදු අනුපාතිකය අදාළ විය යුතුය.

**සේවානියුක්තිය මත වූ ආදායම් බද්ද.**

අවුරුදු පහක (05) කාලසීමාවක් සඳහා උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තියන් පහළොස්දෙනෙකුට (15) යටත්ව ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවා නියුක්තිකයින් ඉහතකී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සේවා නියුක්තියෙන් ලැබෙන ඉපැයීම් සහ ලාභ තුළින් උපචිතවන ආදායම් බදු ගෙවීමෙන් නිදහස් වන්නේය.

**(ආ) 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත.**

ප්‍රාග්ධන සහ ඉදිකිරීම් අයිතම සඳහාවූ විලම්භනය කිරීමේ පහසුකම් 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු (VAT බදු පනත) පනතේ විධිවිධාන ඇතුළත අදාළ වන්නේය.

ව්‍යාපෘති සමාගම විසින් අපනයන කරනු ලබන නිමවුමෙන් 80% ක ප්‍රමාණයකට යටත්ව අමුද්‍රව්‍ය ආනයනය කිරීම සම්බන්ධයෙන් වැට් බදු නිදහස් කිරීමක් විලම්භනය කරනු ලැබිය යුතුය.

**(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත.**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාස තිස්හයක (36) කාලසීමාව තුළ ආනයනය කරනු ලබන සියලුම ප්‍රාග්ධන අයිතම මත සහ 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනතේ සඳහන් පරිදි සහ අවසර ලබාදී ඇති ආකාරයට අමුද්‍රව්‍ය මත වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද (PAL) ගෙවීමෙන් සහ අයකිරීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් කරනු ලැබේ.

**(ඈ) (235 වන අධිකාරයවූ) රේගු ආඥාපනත.**

මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රසිද්ධ කරන ලද අසාදු ලේඛනයේ සඳහන් අයිතම බැහැර කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ආකාරයට ප්‍රාග්ධන අයිතම, ඉදිකිරීම් අයිතම, අමුද්‍රව්‍ය සහ පාරිභෝගික ද්‍රව්‍ය ඇතුලු ව්‍යාපෘතිය ආශ්‍රිත සියලුම අයිතම ආනයනය කිරීම් රේගු බදු ගෙවීමෙන් නිදහස් වන්නේය.

මහින්ද රාජපක්ෂ, පා.ම.
මුදල් අමාත්‍ය

2021 මාර්තු මස 05 වන දින
කොළඹ 01
මුදල් අමාත්‍යාංශයේදීය,